CIABOC



# තෙවසරක් දෙස හැරී බැලීම සහ ඉදිරි ගමන් මග (2017-2019)

2020 ජනවාරි 15

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

නො. 36, මලලසේකර මාවත, කොළඹ 07
Web: www.ciaboc.gov.lk

# අන්තර්ගතය


පසුබිම .......... 2

1. ජයග්‍රහණ .......... 3

1.1 දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සංවර්ධනය කිරීම .......... 3

1.2 නීති සංශෝධන .......... 3

1.3 ඵලදායී මානව සම්පත් .......... 4

1.4 වැරදිකරුවන් කිරීම් සහ වැටලීම් සිදු කිරීම .......... 5

1.5 නිවාරණය / සුපිළිපන් ක්‍රමවේදය .......... 5

1.6 කැබිනට් අනුමැතීන් .......... 6

1.7 තාක්ෂණය භාවිතය .......... 8

1.8 නිර්මාණාත්මක ප්‍රබෝධයක් .......... 8

1.9 අන්තර්ජාතික සහයෝගිතාව .......... 9

1.10 අගය කිරීම් සහ සම්මාන .......... 10

2. අභියෝග .......... 11

2.1 හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක් නොමැතිකම .......... 11

2.2 පහසුකම්වල හිඟ බව .......... 11

2.3 වෘත්තිකයන්ගේ හිඟ බව .......... 12

2.4 ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම .......... 13

2.5 ස්වයං පාලනයක් නොමැතිකම .......... 13

3. අනාගත අපේක්ෂාව .......... 14

# පසුබිම

1994 දී පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) යනු අල්ලස් හා දූෂණයට අදාළ වැරදි විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා නිර්මාණය කරන ලද ස්වාධීන ආයතනයකි. එහෙත් මෙහි දී 2015 වර්ෂය වන තෙක් කොමිසමේ ප්‍රතිසංස්කරණයක් හෝ ශක්තිමත් කිරීමක් සිදු වී නොමැත. යල්පැනගිය නීති, මානව හා ද්‍රව්‍යමය සම්පත්වල හිඟ බව, මූල්‍ය පහසුකම් සඳහා භාණ්ඩාගාරය මත යැපීමට සිදුවීම සහ දඬුවම් ලබා දීමෙන් පමණක් අල්ලස දූෂණය තුරන් කළ හැක්කේය යන මහජනතාව අතර පවතින වැරදි ආකල්ප අල්ලස හා දූෂණය තුරන් කිරීමට ඇති වන ප්‍රධාන බාධාවන්ය.

එනමුත්, ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට අල්ලස් කොමිසම නව ප්‍රතිසංස්කරණ රාශියක් සිදු කරමින් ඉතාමත් වැදගත් සංක්‍රාන්තිමය අවධියක සිටින අතර තියුණු දැක්මක් සහිතව අල්ලසට හා දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා තිරසාර මාධ්‍යයක් ලෙස 'නිවාරණය' යන සංකල්පය පදනම් කරගනිමින් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (National Action Plan) සකස් කිරීම, නිවාරණ කටයුතු, දැනුවත් කිරීමේ වැඩසටහන්, නීති සංශෝධනය කිරීම් සහ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුගත වීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම වැනි පියවරයන් රාශියක් ක්‍රියාත්මක කරමින් සිටී.

අභියෝග මධ්‍යයේ ද මෙම කාර්යභාර්යය සපුරාලමින් අල්ලස් කොමිසම අල්ලස හා දූෂණයට එරෙහිව ශක්තිමත් සටනක නිරත වේ. අල්ලස හා දූෂණය මෙරටින් තුරන් කිරීමේ මහඟු මෙහෙවර අල්ලස් කොමිසමට තනිව කළ හැක්කක් නොවන බව වටහා ගනිමින් සමාජයේ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ද ඇතිව ඉදිරියේ දී කළ යුතු ප්‍රතිසංස්කරණ ගණනාවක් ද සැලසුම් කරමින් සිටී. මෙම වාර්තාව පසුගිය වසර 3 ක අතීතය දෙස ආපසු හැරී බලන අතර අල්ලස් හා දූෂණයෙන් තොර යහපත් රටක් සහ සුපිළිපන් සමාජයක් බිහි කිරීම පිළිබඳව අපගේ අනාගත අපේක්ෂාව සනිටුහන් කරන්නකි.

-CIABOC කණ්ඩායම

# 1. ජයග්‍රහණ

## 1.1 දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සංවර්ධනය කිරීම

- **අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා පස් අවුරුදු ජාතික වැඩපිළිවෙල සකස් කිරීම**

නිවාරණ ක්‍රමවේදය, හරයන් වැඩිදියුණු කිරීම, විමර්ශන ක්‍රමවේදය ශක්තිමත් කිරීම සහ නීති සංශෝධනය කිරීම යන කුළුණු ඔස්සේ ඉදිරි පස් වසර (2019-2023) සඳහා රටට අවශ්‍යව තිබූ දර්ශනයක් සහ සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

- **අත්පොත් හතර**

ජාතික ක්‍රියාකාරී සැලැස්මේ මූලික අංග 04 ක් සාර්ථක කර ගැනීමට ඉවහල් වන අත්පොත් 04 ක් ද එම ජාතික වැඩපිළිවෙල දියත් කරන ලද දින දොරට වඩින ලදී.

මෙම අත්පොත් නිකුත් කොට ඇත්තේ ඉතිහාසයේ ප්‍රථම වතාවට ය. ඒවා නම්,

අ. සුපිළිපන් අත්පොත (Integrity Hand Book)

ආ. තෑගි රීති අත්පොත (Gift Rule)

ඇ. බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ අත්පොත (Conflict & Intent)

ඈ. යෝජිත නව නීති සංශෝධිතවල සාරය අඩංගු අත්පොත ( Essence of Proposed Laws)

- **මාර්ගෝපදේශ අත්පොත්**

විමර්ශකයන්ගේ හා පැමිණිල්ල මෙහෙයවන නීතිඥවරුන්ගේ ප්‍රයෝජනය සඳහා අත්පොත් නිකුත් කිරීම. ඒවා නම්,

i. විමර්ශනය කිරීමට අදාළ අත්පොත

ii. පැමිණිල්ල මෙහෙයවීමට අදාළ අත්පොත

iii. පැමිණිල්ල මෙහෙයවීමට අදාළ මාර්ගෝපදේශ න්‍යායන්

## 1.2 නීති සංශෝධන

- **සංග්‍රහිත නීතියක් කෙටුම්පත් කිරීම**

අවුරුදු 25 කට අධික කාලයක් මුළුල්ලේ අල්ලස් පනත, වත්කම් බැරකම් පනත සහ අල්ලස් කොමිෂන් සභා පනත සංශෝධනය වී නොමැත. ඒ අනුව අන්තර්ජාතිකව අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඉහත නීති තුනම ඇතුළත් කර නව සංග්‍රහිත පනතක් දැනටමත් කෙටුම්පත් කොට එහි අවසන් අදියරේ කටයුතු සඳහා නීති කෙටුම්පත් සම්පාදකතුමිය වෙත භාර කොට ඇත.

- **සංශෝධනය කරන ලද නීති**

පහත සඳහන් නීති දැනටමත් සංශෝධනය කොට ඇත.

i. දූෂණ නඩු මහාධිකරණයේ විභාග කළ හැකි වන ලෙසට 1954 අංක 11 දරන අල්ලස් පනත සංශෝධනය කිරීම.

ii. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවල දී ඉදිරිපත් කරන සාක්ෂි අල්ලස් කොමිෂන් සභාවට ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

## 1.3 ඵලදායී මානව සම්පත්

- **නිවාරණ නිලධාරීන් සහ උපාධිධාරී විශේෂඥ විමර්ශකයන් බඳවා ගැනීම**

කොමිෂන් සභාවට ඉතිහාසයේ කිසිදු දිනයක විධිමත් නිවාරණ ඒකකයක් තිබී නොමැත. එසේම වඩාත් සංකීර්ණ මූල්‍යමය කාරණා ඇතුළත් දූෂණ චෝදනා විමර්ශනය කිරීමට හැකි උපාධිධාරී විමර්ශකයන් සඳහා තනතුරු තිබී නොමැත. එවන් තනතුරු ඇති කොට සංකීර්ණ තෝරා ගැනීමේ ක්‍රියාවලියකින් පසු උපාධිධාරී විමර්ශකයන් 200 ක් ද නිවාරණ නිලධාරීන් 50 ක් ද තෝරා ගෙන ඇති අතර නුදුරේදීම බඳවා ගැනීමට නියමිතයි.

- **නීති සහායකයින් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම**

සම්මුඛ පරීක්ෂණ පවත්වා නීති සහායකින් 17ක් දැනටමත් තෝරා ගෙන ඇති අතර ඉදිරියේ දී ඔවුන් බඳවා ගැනීමට නියමිතය.

- **පරිපාලන පුරප්පාඩු පිරවීම**

අවුරුදු ගණනාවක් තිස්සේ පරිපාලන අංශයට පුරප්පාඩුව තිබූ පහත සඳහන් පරිපාලන නිලධාරී, ගණකාධිකාරී සහ තවත් තනතුරු කිහිපයක් පිරවීමට හැකියාවක් ලබා ගැනීම.

i. අභ්‍යන්තර විගණක

ii. ගණකාධිකාරී

iii. අධ්‍යක්ෂ (සැලසුම්)

iv. තොරතුරු තාක්ෂණ සන්නිවේදන සහකාර

- **හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම**

පහත සඳහන් රාජ්‍යයන් සහ ආයතනවල අනුග්‍රහය යටතේ විමර්ශන, පැමිණිල්ල මෙහෙයවන නීතිඥවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

i. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාංශය (UNODC) යටතේ බැංකොක් නුවර සහ කොළඹ දී

ii. භූතාන් අල්ලස් කොමිෂන් සභාවේ අනුග්‍රහය යටතේ භූතානයේ හා ශ්‍රී ලංකාවේ දී

| | |
|---|---|
| iii. | මැලේසියානු කොමිෂන් සභාවේ විශේෂඥයන් යටතේ මැලේසියාවේ දී හා කොළඹ දී |
| iv. | ඉන්දුනීසියානු කොමිෂන් සභාව යටතේ ඉන්දුනීසියාවේ හා කොළඹ දී |
| v. | ලෝක බැංකුවේ විශේෂඥයන්ගේ හා ස්ලෝවේනියාවේ විශේෂඥයන්ගේ ආධාර යටතේ වත්කම් බැරකම් නීතියට අදාළ වර්ධනයන් කොළඹ දී සාකච්ඡා කිරීම |
| vi. | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය සමඟ ජපානයේ දී |
| vii. | කොරියානු නිලධාරීන් සමඟ කොරියාවේ දී |

## 1.4 වැරදිකරුවන් කිරීම් සහ වැටලීම් සිදු කිරීම

- **සාර්ථක නඩු පැවරීම්**

2018 වර්ෂයේ දී විත්තිකරුවන් අධිකරණය මගින් වරදකරුවන් කරන ලද සංඛ්‍යාව 64කි. 2017 වර්ෂයේ දී වරදකරුවන් කරන ලද සංඛ්‍යාව 52 කි. 2019 වර්ෂය සඳහා වරදකරුවන් සංඛ්‍යාව 2019 නොවැම්බර් 30 දින වන විට 42 කි.

මෑතක දී හිටපු ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියාට එරෙහිව අල්ලස් ගැනීමේ චෝදනාවකට වසර 20 ක බරපතල සිර දඬුවම් නියම කිරීමට ද හැකිවිය. 1954 දී අල්ලස් පනත බලාත්මක කිරීමෙන් පසු වරදකරු කරන ලද ඉහළතම රාජ්‍ය නිලධාරියා සහ පවරන ලද විශාලම අල්ලස් නඩුව මෙය විය.

- **සාර්ථක වැටලීම්**

2019, 2018 සහ 2017 යන තෙවසර තුළ වැටලීම් 224 ක් සිදු කර ඇති අතර ඉන් 113 ක් සාර්ථක වී ඇත.

## 1.5 නිවාරණය / සුපිළිපන් ක්‍රමවේදය

- **මහජනතාව සමඟ සම්බන්ධතා**

දැනුවත් කිරීමේ වැඩසටහන් 192 ක් පවත්වා ඇත.

අල්ලස හා දූෂණයට අදාළ නිශ්චය කාරණාත් නිවාරණ ක්‍රමවේදයන් හා හරයන් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් දිවයින පුරාම මෙම වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභා නිලධාරීන්ට හැකි වී ඇත. ඒ අනුව, පහත සඳහන් පියවර ගෙන ඇත.

| | |
|---|---|
| i. | රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව උදෙසා පවත්වන ලද වැඩසටහන් |
| ii. | පාසල් ශිෂ්‍යයන් අරඹයා වැඩසටහන් පැවැත්වීම සහ සුපිළිපන් සමාජ පැවැත්වීම |
| iii. | පුවත්පත් දැන්වීම්, පෝස්ටර්, අත්පත්‍රිකා තුළින් ජනතාව දැනුවත් කිරීම |

iv. 2019 දෙසැම්බර් 09 වන දින ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය නිමිත්තෙන් දිවයින පුරා ජනතාව ආවරණය වන පරිදි කොටුව දුම්රිය ස්ථානය සහ තවත් දුම්රිය ස්ථාන කිහිපයක් හරහා ගමන් කරන මගීන් 300,000 ක් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී. දූෂණයෙන් තොර සමාජයක් ගොඩ නැංවීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකා බෙදා හැරීම, ජනප්‍රිය කලාකරුවන් විසින් වීදි නාට්‍යය පැවැත්වීම, දිනුම් ඇදීම් සහ තරග පැවැත්වීම සිදු කරන ලදී.

- **සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය**

අල්ලස් කොමිසම මඟින් සිසුන්, උපාධිධාරීන් සහ තරුණ පරම්පරාව දැනුවත් කිරීම සහ අල්ලස්, දූෂණය සහ සාරධර්ම පිළිබඳ සංකල්ප නීති අධ්‍යාපනයට ඇතුළත් කිරීම සඳහා මූලික අඩිතාලම සැකසීම:

i. පාසල් සිසුන් සඳහා වැඩසටහන් පවත්වා ඇති අතර සුපළිපන්න සමාජ පිහිටුවීම.

ii. අල්ලස් හා දූෂණයට එරෙහිව ජාතික හා ජාත්‍යන්තර නීති අධ්‍යාපනයේ කාර්යභාරය පිළිගැනීම සඳහා දූෂණ විරෝධී අධ්‍යයනයන් උසස් අධ්‍යාපන විෂය මාලාවට ඒකාබද්ධ කිරීමේ පියවර ආරම්භ කරයි.

iii. සියලුම විශ්ව විද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සකස් කර ඇත.

- **ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම**

මීට අදාළව චක්‍රලේඛයක් දැනටමත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කර ඇත. ඒ අනුව සෑම රාජ්‍ය ආයතනයකටම සුපිළිපන් නිලධාරියෙකු පත් කළ යුතු අතර අල්ලස හා දූෂණයට එරෙහිව සෑම රාජ්‍ය ආයතනයක් තුළම ආයතනික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු ය.

## 1.6 කැබිනට් අනුමැතීන්

- **අනුමත කරන ලද කැබිනට් පත්‍රිකා**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීමේ අරමුණින් පහත දැක්වෙන කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර ඒවාට අනුමැතිය ලබා ගෙන ඇත.

**නීති සහ යටිතල පහසුකම්**

i. අල්ලස් පනත, වත්කම් බැරකම් පනත හා කොමිෂන් සභා පනත, වෙන වෙනම සංශෝධනය කිරීම සඳහා වූ අනුමැතිය

ii. එම පනත් තුන වෙනුවට එක් සංගෘහිත නව නීතියක් සකස් කිරීම සඳහා වූ අනුමැතිය

iii. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාළ අනුමැතිය (මෙය දැනටමත් පාර්ලිමේන්තුවේ අනුමත කර නීතියක් බවට පත් කර ඇත.)

iv. මහාධිකරණයේ දූෂණ නඩු විභාග කිරීමට හැකි වන පරිදි අල්ලස් කොමිෂන් සභා පනතේ 70 වන වගන්තිය සංශෝධනය
(මෙය දැනටමත් පාර්ලිමේන්තුවේ අනුමත කර නීතියක් බවට පත් කර ඇත.)

v. අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වූ පස් අවුරුදු ජාතික වැඩපිළිවෙල ශ්‍රී ලංකාවේ සුපිළිපන්භාවය වැඩි කිරීම සඳහා සුපිළිපන් රාමුවක් බිහි කිරීමට අදාළ අනුමැතිය

vi. අල්ලස් කොමිෂන් සභාවේ යම් යම් කාර්යයන් ශක්තිමත් කිරීමේ අරමුණින් අන්තර්ජාතික අනුග්‍රාහකයෙක් වන East West කළමනාකරණ ආයතනයෙන් එම අනුග්‍රාහකත්වය ලබා ගැනීම සඳහා අනුමැතිය

vii. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ජාවත්තේ පිහිටි පැරණි ගොඩනැගිල්ල තාවකාලිකව අල්ලස් කොමිෂන් සභාවට ලබා දීමට අනුමැතිය

**අයවැය ප්‍රතිපාදන**

i. නිවාරණය සඳහා දැනුවත් කිරීමට රුපියල් මිලියන 200 ක් වෙන් කිරීම සඳහා අනුමැතිය

ii. පුහුණු කිරීමට අදාළව රුපියල් මිලියන 200 ක් වෙන් කිරීමට අනුමැතිය

- **අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකා**

පහත සඳහන් කැබිනට් පත්‍රිකා දැනටමත් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

i. අල්ලස් කොමිෂන් සභාව ශක්තිමත් කිරීමේ ලා ප්‍රධාන සාධකයක් වන දක්ෂ නීති නිලධාරීන් බඳවා ගැනීම සඳහා ආකර්ෂණීය වැටුපක් ලබා දීමට අදාළ වන කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

ii. අල්ලස් කොමිෂන් සභාවට දැඩි අභියෝගයන් එල්ල වී ඇති සීමා සහිත ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නය විසඳීමේ අරමුණින් අභිනවයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. මෙය අවුරුදු 02 ක් පමණ ප්‍රමාද වූයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලබන නානාවිධ අවහිර කිරීම් නිසාය.

## 1.7 තාක්ෂණය භාවිතය

| |
|---|
| ▪ වත්කම් බැරකම් ප්‍රකාශ මාර්ගගත (Online) ක්‍රමයට අන්තර්ජාතික ප්‍රමිතියට අනුව ලබා ගැනීම |
| මෙතෙක් අත් අකුරින් ලියා ඉදිරිපත් කළ වත්කම් බැරකම් ප්‍රකාශ වෙනුවට මාර්ගගත (Online) ක්‍රමය යටතේ ඉදිරිපත් කිරීමෙන් රාජ්‍ය නිලධාරියාට හා විමර්ශන නිලධාරියාට ඉමහත් පහසුවක් සපයනු ලබන අතර ඒ අනුව විමර්ශනය කඩිනම් කළ හැකි වේ. රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් ප්‍රකාශ ලබා ගැනීමත් ඒවා විශ්ලේෂණය කිරීම සඳහා මධ්‍යගත ඒකකයක් අල්ලස් කොමිෂන් සභාව තුළ පිහිටවනු ඇත.<br>ලෝක බැංකුව හා ස්ලෝවැකියාව, ඉංදුනීසියාව වැනි රටවල් වල සහ ICTA ආයතනයේ සහයෝගය ඇතිව දැනටමත් මාර්ගගත අයදුම් පත්‍රය (Online Form) සකසා ඇති අතර අවශ්‍ය නීති නුදුරේදීම සම්මත වීමෙන් පසු මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| ▪ **ආකර්ෂණීය වෙබ් අඩවියක්** |
| මෙම කොමිෂන් සභාව සඳහා ආකර්ෂණීය හා පුළුල් වෙබ් අඩවියක් සැකසීම. මෙම වෙබ් අඩවිය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ හොඳම වෙබ් අඩවි පහෙන් එකක් ලෙස පිළිගැනීමට ලක්විය. අල්ලස් කොමිසම වෙත වෙබ් අඩවිය හරහා පහසුවෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර කොමිසම වෙත පැමිණ, ලිපි මඟින්, හදිසි ඇමතුම් අංකය හරහා, ජංගම දුරකථන මඟින්, SMS පණිවිඩ මඟින්, ෆැක්ස් මඟින් හා විද්‍යුත් තැපැල් මඟින් ද පැමිණිලි ඉදිරිපත් කළ හැක. |

## 1.8 නිර්මාණාත්මක ප්‍රබෝධයක්

| |
|---|
| ▪ **නිර්මාණාත්මක මාධ්‍ය භාවිතය** |
| නිර්මාණාත්මක මාධ්‍ය භාවිතා කරමින් සුපළිපන්න හා දූෂණ විරෝධී සාරධර්ම මහජනයා තුළ ඇති කිරීම:<br>i. සුපිළිපන් බව උද්දීපනය කිරීම සඳහා ලංකාවේ අග්‍රගණ්‍ය ගීත රචකයෙකුගේ සංගීතඥයකුගේ හා ගායකයෙකුගේ සහභාගීත්වයෙන් ගීතයක් නිර්මාණය කිරීම<br>ii. අල්ලස් ලබා ගැනීමේ ප්‍රතිවිපාක පෙන්වන ආකර්ෂණීය රූපවාහිනී සහ ගුවන් විදුලි වෙළඳ දැන්වීම් සකස් කිරීම.<br>iii. දූෂණයට එරෙහි පණිවුඩය සියල්ලන්ම රස විඳින කලාවේ අනුවාදයක් වන නාට්‍ය තුළින් ගෙන ඒම.<br>iv. අල්ලස් හා දූෂණයට එරෙහිව සටන් කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කරමින් දූෂණ විරෝධී චිත්‍රකතා පොත්, පෝස්ටර් ප්‍රදර්ශනය සහ මුද්‍රිත පුවත්පත් දැන්වීම් පළ කිරීම ආදී ඉතා ඵලදායී වැඩසටහන් දියත් කිරීම. |

## 1.9 අන්තර්ජාතික සහයෝගිතාව

| |
|---|
| ▪ **අන්තර්ජාතික සබඳතා දියුණු කිරීම සහ බැඳියාවන් ඉෂ්ට කිරීම** |
| i. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් කේන්ද්‍රීය පුද්ගලයා වනුයේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයායි. එම ප්‍රඥප්තියේ නියම කර ඇති පරිදි එයට ශ්‍රී ලංකාව අනුගත වීම සලකා බැලීම සඳහා 2016 හා 2018 වර්ෂවල දී පැවති විශ්ලේෂණ වට දෙකක් ශ්‍රී ලංකාව මේ වන විට අවසන් කර ඇත. වාර්ෂිකව එක්සත් ජාතීන් විසින් පවත්වනු ලබන විවරණය කිරීම සඳහා වූ රැස්වීම්වලට සහභාගී වී ක්‍රියාකාරී දායකත්වය දැක්වීම සිදු කර ඇත. |
| ii. GSP+ සහනය නැවත ලබා ගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ශ්‍රී ලංකාවට සපයන මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ මහ බැංකුවේ ඉල්ලීම මත මෙම කොමිෂන් සභාව ඉතාමත්ම තීරණාත්මක කාර්යභාරයක් සිදු කර ඇත. ශ්‍රී ලංකාවෙන් අල්ලස දූෂණය තුරන් කිරීම සඳහා කවර ආකාරයේ ප්‍රතිසංස්කරණයක් කර ඇත්දැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් සහ යුරෝපා සංගමය මගින් සොයා බැලීම සිදු කරයි. |
| iii. ජනාධිපති ලේකම් කාර්යලයේ නියාමනය යටතේ ක්‍රියාත්මක වන විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය (Open Government Partnership - OGP) සඳහා සක්‍රිය දායකත්වයක් දක්වා එහි නිර්ණායක අනුව සාර්ථක ප්‍රගතියක් ලබා ගැනීමට කටයුතු කිරීම. |
| iv. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරාධනය පරිදි ලෝකයේ විශේෂඥවරුන් 30 දෙනෙක් පමණ ශ්‍රී ලංකාවට ගෙන්වා **"කොළඹ විවරණය"** සකස් කිරීම සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීමට හැකිවීම. |
| v. ඒ අනුව, ප්‍රඥප්තියේ සඳහන් 6 හා 36 වගන්ති අනුව දූෂණයට එරෙහි ආයතන ස්වාධීනව කටයුතු කිරීම සහ ක්‍රියාශීලී කිරීම සම්බන්ධයෙන් වන 2012 ජකර්තා ප්‍රඥප්තිය සඳහා කොළඹ විවරණය කෙටුම්පත් කිරීමට හැකි වූ අතර සහ එය 2019 දෙසැම්බර් මස අබුඩාබි නුවර දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එය නිල වශයෙන් දියත් කරන ලදී. |
| vi. ජාතික වැඩපිළිවෙල දියත් කිරීමේ උත්සවයට තානාපති නිලධාරින් සහ අන්තර් ජාතික ආයතනවල රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් 52 දෙනෙකු සහභාගි වීම. |
| vii. ශ්‍රී ලංකවේ දූත කණ්ඩායම් භූතානය, ඉන්දුනීසියාව, හොංකොං, කැනඩාව සහ මැලේසියාව යන රටවලට යැවීමට හැකිවීම. එසේම භූතානය, ඉන්දුනීසියාව, ස්ලෝවේනියාව හා මැලේසියා යන රටවල්වල විශේෂඥයන් ශ්‍රී ලංකාවට පැමිණීම. |

viii. වත්කම් බැරකම්වලට අදාළ නීතිය සහ නව ඉලෙක්ට්‍රොනික පෝරමයක් සකස් කිරීම සම්බන්ධයෙන් හසල දැනුමක් තිබෙන ලෝක බැංකුවේ විශේෂඥයන් සමඟ සාකච්ඡා වාර ගණනාවක් කොළඹ දී පැවැත්වීමට හැකිවිය.

ix. නුදුරේදීම බඳවා ගනු ලබන විමර්ශන නිලධාරීන්, නීති නිලධාරීන් සහ නීති සහායකයින් හට පුහුණුව ලබා දීමේ අරමුණින් හොංකොං, සිංගප්පූරුව, මැලේසියාව, භූතානය යන රටවල අල්ලස දූෂණයට එරෙහි ආයතනවල ප්‍රධාන කොමසාරිස්වරුන් සහ අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡා කරන ලදී. පුහුණුව සඳහා සම්පත් දායකයන් ලංකාවට ලබා දීම සම්බන්ධයෙන් ඔවුන්ගේ ධනාත්මක ප්‍රතිචාරය ලබා ගැනීමට හැකි විය. එසේ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබුණේ 2019 දෙසැම්බර් මාසයේ අබුඩාබි නුවර දී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය අතරතුර දී ය.

- **අන්තර්ජාතික සහයෝගිතාව**

අල්ලස් කොමිෂන් සභාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් පහත සඳහන් අන්තර්ජාතික ආයතනවලින් සහයෝගය ලබා ගැනීමට හැකිවීම.

i. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමරිකානු නියෝජිත ආයතනය (USAID)

ii. East West කළමනාකරණ ආයතනය

## 1.10 අගය කිරීම් සහ සම්මාන

- **රන් සම්මානය**

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, හොඳම රාජ්‍ය ආයතන අතරින් දෙවන ස්ථානය ලෙස තෝරා ගන්නා ලද අතර එම විශිෂ්ට දක්ෂතාවය නිසා 2019 ජූලි මස දී රන් සම්මානයක් ප්‍රදානය කරන ලදී.

- **වෙබ් අඩවිය සඳහා කුසලතා සම්මානය**

2017 දෙසැම්බර් මස 20 වන දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නව වෙබ් අඩවියක් විවෘත කරන ලද අතර එය 2018 වසරේ ලංකාවේ රාජ්‍ය ආයතනවල (bestweb.lk 2018) හොඳම වෙබ් අඩවි 5 අතරට තේරී පත් වූ අතර කුසලතා සම්මානයක් දිනා ගෙන ඇත.

# 2. අභියෝග

## 2.1 හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක් නොමැතිකම

- **අදාළ පාර්ශවයන් තුළ ගැඹුරු දැක්මක් හා අභිලාෂයක් නොමැතිකම**

අදාළ පාර්ශ්වකරුවන් තුළ ගැඹුරු දැක්මක් හා අභිලාෂයක් නොමැතිවීම අල්ලස හා දූෂණය තුරන් කිරීමේ දී විශාල බාධකයක් වේ. අදාළ පාර්ශ්වකරුවන් තමන්ගේ වගකීම් පැහැර හැරීම හෝ ඒවායින් ලිස්සා යෑමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් ජනාධිපති ලේකම්තුමා විසින් නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් තුළම සුපිළිපන් නිලධාරියෙක් පත් කළ යුතු බවට නියම කළ ද බොහොමයක් රාජ්‍ය ආයතන මෙය තවමත් ක්‍රියාත්මක කර නෙමැත. එබැවින් අල්ලස දූෂණය තුරන් කිරීමට ගැඹුරු දැක්මක් හා අභිලාෂයක් සහිත නායකත්වයක් තිබිය යුතුය.

- **මහජනයාගේ සාමූහික උත්සාහය නොමැතිකම**

අල්ලස දූෂණය තුරන් කිරීමේ ලා තවත් අභියෝගය වන්නේ බොහෝ ජනතාවගේ පවතින වැරදි ආකල්පයයි. ඔවුන් සිතන්නේ අල්ලස හා දූෂණය තුරන් කිරීමේ රාජකාරිය සිදු කළ යුත්තේ අල්ලස් කොමිෂන් සභාව විසින් පමණක් බවත් දඬුවම් ලබා දුන් පමණින් අල්ලස හා දූෂණය තුරන් වන බවත් ය. මෙවැනි ආකල්ප අල්ලස හා දූෂණය තුරන් කිරීමෙ දී විශාල අභියෝගයකි. මේ වෙනුවට දඬුවම් කිරීමට වඩා නිවාරණය යන අදහස වඩා වැදගත් යන්න සමාජය විසින් දැනගත යුතු අතර එය සමාජ සම්මතයක් බවට පත් විය යුතු ය. එසේම සාරධර්ම හා සුපිළින් ගති පැවතුම් ප්‍රගුණ කිරීම තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සිදු කළ හැක්කේය යන්න ජනතාව ඒත්තු ගත යුතුය.

## 2.2 පහසුකම්වල හිඟ බව

- **යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම**

කොමිෂන් සභාවේ ගොඩනැගිල්ලක් කඩා වැටීමට ආසන්න තත්ත්වයකට පත් වී ඇති නිසා වහාම ඉන් ඉවත්වන ලෙස රජයේ ඉංජිනේරුවරයා නිර්දේශ කරන ලදී. ඒ අනුව ජනාධිපතිතුමාගේ හිටපු ලේකම්තුමාගේ මැදිහත් වීමෙන් කැප්පෙට්ටිපොළ මාවතේ පිහිටි පැරණි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගොඩනැගිල්ලට විමර්ශන නිලධාරීන් 100 දෙනෙකු අනුයුක්ත කිරීමට සිදු විය. නමුත් එම ස්ථානයෙන් ද ඉවත් වීමට නිලධාරීන්ට සිදු වී ඇත. එබැවින් අල්ලස් කොමිෂන් සභාවට සිදු වී ඇත්තේ විමර්ශනය කිරීම නොව ඉතා සීමිත පහසුකම් ලබන තම කාර්ය මණ්ඩලයට සිටින්නට වහලයක් සොයා ගැනීමයි. මෙම ගැටලුකාරී තත්ත්වය තේරුම් ගනිමින් වසර 1 ½ කට පමණ පසු ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අනුමැතිය ලබා දී ඇත. දැන් කොමිෂන් සභාව වෙත ඇති අභියෝගය වන්නේ ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් කර ගෙන කඩිනමින් ගොඩනැගිල්ල ඉදි කර ගැනීමයි.

## 2.3 වෘත්තිකයන්ගේ හිඟ බව

| |
|---|
| ▪ **නීති නිලධාරීන්ගේ වැටුප් හා දීමනා ප්‍රමාණවත් නොවීම** |
| පැමිණිල්ල මෙහෙයවීමටත්, විමර්ශන අවස්ථාවේ දී විමර්ශයන්ට උපදෙස් දීම සඳහාත් අල්ලස් කොමිෂන් සභාවට දක්ෂ නීති නිලධාරීන් බඳවා ගත යුතුය. එසේ බඳවා ගැනීම අභියෝගයක් වී ඇත්තේ නීති නිලධාරීන් සඳහා දැනට පවතින වැටුප්තලය ඉතාමත්ම පහළ තත්ත්වයක තිබීමයි. ඔවුන්ගේ වැටුප් හා වේතන නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වැටුප් වේතන සමඟ සැසඳීමේ දී එයින් 1/3 ක් පමණ වේ. නීති නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා දැනට අවුරුදු 1 ½ ක සිට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණ ද රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත මුදල් අමාත්‍යාංශයෙන් සහ ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් මේ සඳහා නිරන්තර බාධා කිරීම් සිදු කරනු ලැබේ. එබැවින් දැනට කොමිෂන් සභාවේ රාජකාරී වල නිරත වන්නේ නීති නිලධාරීන් 28 දෙනෙකු පමණක් වන අතර තව ද නීති අංශ නිලධාරීන් 19 දෙනෙකු සඳහා පුරප්පාඩු ඇත. |
| ▪ **විශේෂ විමර්ශකයින්ගේ හිඟකම** |
| වර්තමානය වන විට, 1994 දී නියම කර ඇති යල් පැන ගිය නිර්ණායක යටතේ ශ්‍රී ලංකා පොලිසියෙන් අනුයුක්ත කරන ලද පොලිස් නිලධාරීන් විසින් පරීක්ෂණ සිදු කරනු ලැබේ. උපාධිධාරී ගණකාධිකාරිවරුන්, විගණකවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ තොරතුරු තාක්ෂණ නිලධාරීන් විමර්ශකයින් මෙම කොමිෂන් සභාවට නොමැති අතර දූෂණය අවම කළ හොංකොං, මැලේසියාව, සිංගප්පූරුව සහ භූතානය වැනි රටවල්වල ඇති දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතනවලට පොලිස් නිලධාරීන් නොවන විශේෂ විමර්ශකයින් යොදවයි.<br><br>ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22 ක් වුවද අල්ලස හා දූෂණය තුරන් කිරීමට අදාළ විමර්ශන සිදු කරනු ලබන්නේ විමර්ශකයන් 160 දෙනෙකු පමණි. ඔවුන්හට විමර්ශනය සිදු කිරීම සඳහා ගොනු 3500 කට ආසන්න ප්‍රමාණයක් ඇත. බොහෝ අංශවල නිලධාරීන් 15 ත් 20 ත් අතර ප්‍රමාණයක් සිටින අතර සාමාන්‍යයෙන් ඔවුන්ට විමර්ශන 500 ක් පමණ සිදු කිරීමට සිදුවේ. සංසන්දනාත්මකව විමසන කල, මිලියන 06 ක ජනගහනයක් සිටින හොංකොං දේශයේ දූෂණයට එරෙහි කොමිෂන් සභාවේ විශේෂඥ විමර්ශන නිලධාරීන් 1000 ක් පමණ සිටී. එමනිසා කඩිනම් හා ඵලදායී පරීක්ෂණ සඳහා බාධකයක් ලෙස විමර්ශන නිලධාරීන්ගේ හිඟයක් පවතින බව පැහැදිලිවම පෙනේ.<br><br>එබැවින්, අභියෝග කිහිපයක් මධ්‍යයේ, පසුගිය වසර දෙක තුළ MN 5 වැටුප් පරිමාණය යටතේ විමර්ශන නිලධාරීන් සඳහා නව තනතුරු 200 ක් අනුමත කර ගැනීමට හැකි වී තිබේ. නව නිලධාරීන් දැනටමත් තරගකාරී තේරීම් ක්‍රියාවලියකින් අනතුරුව තෝරාගෙන ඔවුන් විධිමත් ලෙස බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. |

## 2.4 ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම

- **ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම**

සාමාන්‍ය අපරාධ වලින් අල්ලස් හා දූෂණ අපරාධ වෙනස් වන්නේ ඒවායේ ඇති රහසිගතභාවය හා ඒවා පිළිබඳ පැමිණිලි කිරීමට මහජනතාව තුළ පෙළඹවීමක් ඇති නොවන බැවිනි. ඉහළ පෙළේ පුද්ගලයන් අල්ලස් ගැනීමට එරෙහිව ව්‍යාපාරිකයන්, ආයෝජකයන් වැනි අය පැමිණිලි කරන්නේ ද ඉතාමත්ව කලාතුරකිනි.

තවද දූෂණ නඩු සම්බන්ධයෙන් පැමිණිල්ල ඉදිරිපත් කරන අය හුදෙක් පවසන්නේ ප්‍රවාදක (අසා දැන ගත්) සාක්ෂිය. ඒ අනුව එම ගනුදෙනුවට අදාළ තොරතුරු ගැන පුද්ගලික අවබෝධයක් ඔවුන්ට නොමැති අතර අධිකරණයක් ඉදිරියේ දී ඔවුන් සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කළ නොහැකිය. බොහෝ දූෂණ නඩු රඳා පවතිනුයේ ලේඛන මතය. බොහෝ ලේඛන කාලයාගේ ඇවෑමෙන් සොයා ගැනීමට නොහැකි අතර එම ලේඛන රාජ්‍ය ආයතනවලින් ගෙන්වා ගැනීම දුෂ්කර වී ඇත. බොහෝ රාජ්‍ය ආයතන ඒවා ලබා ගැනීමට සහයෝගය නොදක්වයි. එම ලේඛන සොයා ගත්ත ද එම ලේඛනවලින් බොහෝවිට නිශ්චිත ලෙස යම් පුද්ගලයෙක් වෙත වගකීමක් ආරෝපණය නොකරයි. ඊට හේතු වන්නේ පවතින චක්‍රලේඛ සහ රෙගුලාසි දුර්වලවීමයි. මේ හේතුව නිසා අධිකරණයේ දී පැමිණිල්ලට දැඩි අභියෝගයකට මුහුණ දීමට සිදු වේ.

## 2.5 ස්වයං පාලනයක් නොමැතිකම

- **බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය ස්වාධීන ද?**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විමර්ශකයන් හා නීති නිලධාරීන් බඳවා ගැනීමේ දී අවශ්‍ය නිර්නායක සපයනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය විසිනි. රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව විමර්ශනය කරනු ලබන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශකයන්ගේ සුදුසුකම් කවරක්ද යන්න එවන් ආයතන විසින් නිර්ණය කිරීම සැබවින්ම ඛේදනීයය. හොංකොං, සිංගප්පූරුව, මැලේසියාව, භූතානය වැනි රටවල තම කොමිෂන් සභාවට අවශ්‍ය දක්ෂ නිලධාරීන් බඳවා ගැනීමේ නිර්ණායකය සකස් කිරීමේ ස්වාධීනත්වය එම කොමිෂන් සභාවලට පවරා ඇත.

- **මුදල් ප්‍රතිපාදන**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් වුව ද අල්ලස හා දූෂණය තුරන් කිරීමට ප්‍රමාණවත් ලෙස මුදල් වෙන් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට හා අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම් කිරීමට සිදු වී ඇත. ඔවුන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුවේ අල්ලස හා දූෂණය තුරන් කිරීම කිසිසේත්ම අඩංගු වී නොමැත. මෙය ද අල්ලස් කොමිසම මුහුණ පා ඇති විශාල අභියෝගයකි.

එක්සත් ජාතීන්ගේ විශේෂඥයන් ලොව පුරාවට කරන ලද සමීක්ෂණවලින් අනාවරණය කරගෙන ඇත්තේ යම් රටක අල්ලස දූෂණය තුරන් කිරීමට නම් එම රටේ ජාතික අයවැයෙන් යටත් පිරිසයින් 0.1% ක ප්‍රමාණයක්වත් අල්ලස දූෂණය තුරන් කරන ආයතනයට වෙන් කළ යුතු බවයි. හොංකොං දේශයේ ඒ සඳහා 0.2 % ක් වෙන් කොට ඇත. නමුත් ශ්‍රී ලංකාවේ අල්ලස් කොමිසමට වෙන් කර ඇත්තේ ජාතික අයවැයෙන් 0.05% ක් වැනි ඉතාමත්ම අල්ප මුදලකි.

# 3. අනාගත අපේක්ෂාව

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සීමිත සම්පත් ප්‍රමාණයක් යටතේ වුවද දැවැන්ත ප්‍රතිසංස්කරණ සිදු කරමින් මෙරටින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා ප්‍රබල උත්සාහයක යෙදී සිටී. සැබෑ ලෙසම අල්ලස දූෂණය තුරන් කිරීම සඳහා දේශපාලන අභිලාශයත් මානව සම්පත්වල වැඩිදියුණු කිරීමත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සම්පූර්ණ සහයෝගය ලබා දෙනු ඇතැයි උදෙක්ම අපේක්ෂා කෙරේ.

- ශ්‍රී ලංකාවේ අල්ලස් හා දූෂණයට එරෙහිව සාර්ථකව සටන් කිරීම සඳහා පුළුල් නීති සම්පාදනය කිරීමේ අරමුණින් කෙටුම්පත් කිරීමේ අවසන් අදියරේ පවතින අල්ලස් පනත, වත්කම් ප්‍රකාශන නීතිය සහ අල්ලස් කොමිසමේ පනත ඇතුළත් **සංයුක්ත නීතිය** නීතිගත කිරීම.

- විද්‍යුත් පාලනය (e-governance) දිරිමත් කරනු ලබන තත්ත්වයක් තුළ **මාර්ගගත (online) වත්කම් ප්‍රකාශන පද්ධතිය** ක්‍රියාත්මක කිරීම.

- අල්ලස් කොමිසමෙහි වෘත්තිකයන්ගේ හිඟය පියවීම සඳහා **නිවාරණ නිලධාරීන් 50ක්, නීති සහායකයින් 17 ක් සහ විශේෂ විමර්ශකයින් 200 ක්** බඳවා ගැනීමට අවසාන අනුමැතිය ලබා ගැනීම සහ ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

- **නිවාරණ** උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ සෑම රාජ්‍ය ආයතනයක් තුළම **සුපිළිපන් නිලධාරීන්** පත් කිරීම සහතික කිරීම.

- අල්ලස් කොමිසම **සඳහා ප්‍රමාණවත් කාර්යාල අවකාශයක් ලෙස** ගොඩනැගිල්ල **ඉදිකිරීම.**

- අල්ලස් හා දූෂණයට එරෙහිව ජාතික හා ජාත්‍යන්තර නීති අධ්‍යාපනයේ කාර්යභාරය වටහා ගනිමින් **දූෂණ විරෝධී අධ්‍යයනයන්** උසස් අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් කිරීම.

- නීතිපති දෙපාර්තමේන්තුවට සමාන වන පරිදි **අල්ලස් කොමිසමෙහි නීති නිලධාරීන්ගේ** වැටුප් වැඩි **කිරීමෙන් දක්ෂ නීති නිලධාරීන්** බඳවා **ගැනීම.**

- **අවශ්‍ය කාර්ය මණ්ඩලය** බඳවා ගැනීමට හැකිවන පරිදි අල්ලස් කොමිසම බල ගැන්වීම.